**ස්ථානය - යටියන්තොට ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාව** **දිනය - 2022.11.22** **වේලාව - පෙ.ව.9.00**

**සහභාගි වූ ගරු මහජන නියෝජිතයින්**

1.ගරු සභාපති - කේ.ඩී.වසන්ත මැතිතුමා
2.ගරු උප සභාපති - ඒ.වී.රොහාන්ත ගුණසේකර මැතිතුමා

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී**

3. ඒ.එම්.සත්‍යානන්දන් මැතිතුමා
4. කේ.ජී.සුමනතිස්ස ජයතිලක මැතිතුමා
5 ජී.ම්.නන්දසේන වික්‍රමසූරිය මැතිතුමා
6. ආර්.එම්.එස්.ඩබ්ලිව්.රාජපක්ෂ බණ්ඩාර මැතිතුමා
7. ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා
8. ඩබ්ලිව් .කතිකා දමයන්ති මැතිනිය
9. කේ.කේ.නිමල් විජේසූරිය මැතිතුමා
10 .එන්.කේ.නිමල් කුමාරසිරි මැතිතුමා
11. ඒ.ජී.තිලකරත්න මැතිතුමා
12.ඩි.ඒ.සුනිල් දෙයියාගල මැතිතුමා
13.එම්.ඩබ්.හිමන්ත අජිත් බණ්ඩාර මැතිතුමා
14.එච්.ශාන්ත කුමාර හෙට්ටිකන්ද මැතිතුමා
15.ඩි.පි.ප්‍රේමසිරි ජයලත් මැතිතුමා
16.ජී.ආර්.ලාල් නිශාන්ත මැතිතුමා
17.ඩබ්.ජී.සරත් ප්‍රේමසිරි මැතිතුමා
18.එස්.සුදර්ශන් මැතිතුමා
19.ටී.පී.ජී.ඩබ්.කීර්තිසේන අල්විස් මැතිතුමා
20 එච්.ඒ.දිල්සානි ප්‍රශාදිකා මැතිනිය.
21.කේ.මධුෂිකා ප්‍රශාදනි ජයසිංහ මැතිනිය
22.එම්.ඩි.ඥානවති මැතිනිය
23.ටී.ඉමල්කා සංජීවනි මැතිනිය
24.බී.සීතා රංජනි මැතිනිය
25.ඒ.පී.ඩබ්ලිව්.එම්.ඩයනා උදයංගනි මැතිනිය
26.කේ.කමල්රාජ් මැතිතුමා

**සහභාගි වූ නිලධාරින්**

1.ලේකම් - දුමින්ද සී.වික්‍රමසිංහ මහතා
2.සංවර්ධන නිලධාරි - ආර්.එච්.සී.නිසාන්ති සෙනවිරත්න මිය

**ගරු මහ සභාවට නොපැමිණි මන්ත්‍රිවරුන්ගේ නාම ලේඛනය**

01.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.ඒ.ප්‍රියන්ත පුෂ්පකුමාර මැතිතුමා
02.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිතුමා - පී.ඩබ්.අමිල හේමන්ත මැතිතුමා

ගරු සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැමිණි සිටි සියළුදෙනා ආගම සිහි කිරිමෙන් අනතුරුව ජාතික ගීය හා පළාත් පාලන ගීය ගායනයෙන් හා මියගිය රණවිරුවන් හට හා සභිකයින් ලෙස කටයුතු කර මිය ගිය මන්ත්‍රිතුමන්ලා හට ,කාර්යය මණ්ඩලයට ගෞරව කිරිමෙන් පසු සභාවේ කටයුතු පෙරවරු 9.00 ආරම්භ කරන ලදී.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**

අද දින පැවැත්වෙන මහ සභා රැස්වීම සඳහා සහභාගි වි සිටින ගරු මන්ත්‍රිතුමන්ලා හා මන්ත්‍රිතුමියන්ලා ,කාර්යය මණ්ඩලය ගෞරවයෙන් සෙනෙහසින් යුතුව පිළිගනු ලබනවා.සභාවේ කටයුතු ඉදිරියට කරගෙන යාම සඳහා ඔබතුමන්ලාගේ නොමඳ සහයෝගය ලබාදෙන ලෙස කාරුණිකව දන්වමි.

**(අ) පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරිම**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** 2022.10.26 වන දින පැවති මහ සභා රැස්වීම් වාර්තාව මා විසින් ඔබ වෙත එවා ඇති අතර ඔබ සියළු දෙනා විසින් එය කියවූවා සේ සලකා එහි කිසියම් නිවැරදි කිරිම් හෝ සංශෝධන නොමැති නම් වාර්තා කර ඇති පරිදි ස්ථිර කරන ලෙසට හා නිවැරදි කිරිම් හෝ සංශෝධන ඇත්නම් එය සංශෝධනය කරන ලෙසත් සභාවට මා දන්වා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා** ගරු සභාපතිතුමනි, ගරු මහ සභාවට ඉදිරිපත් කරන ලද 2022.10.26 වන දින පැවැති මහ සභා රැස්වීම් වාර්තාව සංශොධන රහිතව සභා සම්මත කිරිම සුදුසු බව මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.නන්දසේන වික්‍රමසූරිය මැතිතුමා** ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** 2022.10.26 වන දින පැවති මහ සභා රැස්වීම් වාර්තාව සංශෝධන රහිතව සභා සම්මත වූ බව ගරු මහ සභාවට නිවේදනය කර සිටිනවා.

**(ආ) සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන** ***.** සිටුවා කප්රුකක් - කරමු දැයට මෙහවරක් - ජාතික පොල් වගා සංග්‍රාමය 2022. වැඩ සටහන යටතේ බදුන් පොල් පැළ සහ බිම් පොල් පැළ සහනදායි මිලට ලබා ගැනිම සඳහා කැගල්ල පොල් වගා කිරිමේ මණ්ඩලයේ ප්‍රාදේශිය කාර්යාලයේ කළමණාකරු සමඟ සම්බන්ධීකරණය කර ගන්නා ලෙස දන්වා ඇත.

**(ඇ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ,පෙත්සම්,පැමිණිලි ඉදිරිපත් කිරීම**
**(ඈ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත**
**(ඉ) කල් දී ඇති යෝජනා**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 01. මෙම සභාවේ සේවා ගිවිසුම් මත සේවයේ නියුතුව සිටින වැඩ ක්ෂේත්‍ර කම්කරු ආර්.කේ.ජී.ධනුෂ්ක සම්පත් බණ්ඩාර මයාගේ සේවා ගිවිසුම් කාලය 2022.12.14 දිනෙන් අවසන් වේ.සේවා ගිවිසුම් දීර්ඝ කිරීම සම්බන්ධයෙන් තීරණයක් ගැනීම සඳහා මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.එස්.ඩබ්.රාජපක්ෂ බණ්ඩාර මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.ඒ අනුව 2023.12.14 වන දින දක්වා සේවා ගිවිසුම දීර්ඝ කිරීම සුදුසු බව ප්‍රකාශ කරසිටිනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් 2023.12.14 වන දින දක්වා සේවා ගිවිසුම දීර්ඝ කිරීම සඳහා සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් 2023.12.14 වන දින දක්වා සේවා ගිවිසුම දීර්ඝ කිරීම සඳහා ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 01)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 02. 2022 වර්ෂයට අදාල යටියන්තොට ප්‍රාදේශීය සභාවෙහි භාණ්ඩ සමීක්ෂණ කටයුතු 2023 ජනවාරි මාසය තුළ සිදු කළ යුතුව ඇත.එබැවින් භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය සඳහා සභාවෙන් පත් කරනු ලබන ගරු මන්ත්‍රීවරු 03 ක් සහ 06 දෙනෙකුගෙන් සමන්විත නිලධාරි මණ්ඩලය තීරණය කිරීමට ගරු මහ සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා මා යෝජනා කරනවා.
**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.එස් ජයතිලක මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය සඳහා ගරු උප සභාපති ඒ.වි.රොහාන්ත ගුණසේකර මැතිතුමා,ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජිව අබේකෝන් මැතිතුමා,ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.ආර් ලාල් නිශාන්ත මැතිතුමා ,කළමනාකරන සේවා නිලධාරි සන්ධ්‍යා කුමාරි මිය ,කළමනාකරන සේවා නිලධාරි ඩී.එස්.ජී.එස්.දුණුවලපිටිය මිය,සං.නිල එස්.පී.ධර්මතිලක මහතා,සං.නිල ඉන්දු රාමනායක මිය,කළ.සේ.නිල සමීරා බදූර්දින් මිය ,පුස්තකාල සහයක සුචීරා මෙනවිය සුදුසුයැයි මා ප්‍රකාශ කර සිටිනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාවට අනුව භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය සඳහා ගරු උප සභාපති ඒ.වි.රොහාන්ත ගුණසේකර මැතිතුමා,ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජිව අබේකෝන් මැතිතුමා,ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ආර් ලාල් නිශාන්ත මැතිතුමා ,කළමනාකරන සේවා නිලධාරි සන්ධ්‍යා කුමාරි මිය ,කළමනාකරන සේවා නිලධාරි ඩී.එස්.ජී.එස්.දුණුවලපිටිය මිය, සං.නිල එස්.පී.ධර්මතිලක මහතා,සං.නිල ඉන්දු රාමනායක මිය,කළ.සේ.නි සමීරා බදූර්දීන් මිය පුස්තකාල සහයක සුචීරා මෙනවිය පත් කිරීම සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය සඳහා ගරු උප සභාපති ඒ.වි.රොහාන්ත ගුණසේකර මැතිතුමා,ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජිව අබේකෝන් මැතිතුමා,ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ආර් ලාල් නිශාන්ත මැතිතුමා ,කළමනාකරන සේවා නිලධාරි සන්ධ්‍යා කුමාරි මිය ,කළමනාකරන සේවා නිලධාරි ඩී.එස්.ජී.එස්.දුණුවලපිටිය මිය,සං.නිල එස්.පී.ධර්මතිලක මහතා,සං.නිල ඉන්දු රාමනායක මිය,කළ.සේ.නි සමීරා බදූර්දීන් මිය ,පුස්තකාල සහයක සුචීරා මෙනවිය පත් කිරීම ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

**(සභා තීරණ අංක 02)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 03. 1987 ප්‍රාදේශීය සභා පනතේ 168 (1) වගන්තිය ප්‍රකාරව වූ 2023 වර්ෂයේ අයවැය ලේඛනය ගරු මහ සභාව වෙත ඉදිරිපත් කරන අතර ,ඒ සඳහා එම පනතේ 168 (2) වගන්තිය යටතේ ගරු මහ සභාවේ අනුමැතිය ලබා ගැනිම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාව

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා** ගරු සභාපතිතුමනි,ඒ යෝජනාව මා ස්ථිර කරනවා. එක්සත් ජාතික පක්ෂයේ සහය මේ අයවැයට ලබා දෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.නන්දසේන වික්‍රමසූරිය මැතිතුමා** ගරු සභාපතිතුමනි,අද පැමිණ සිටින සියළුම මන්ත්‍රී මණ්ඩලයගේ සහයෝගය මේ අය වැයට ලබා දෙනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 03)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 04. යටියන්තොට ප්‍රාදේශීය සභාව සතු ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානය සඳහා අවශ්‍ය ඖෂධ වර්ග ඇම්.ඩී.ලිවේරිස් අමරතුංග සහ පුත්‍රයෝ ආයතනය වෙතින් සපයා ගැනීම වෙනුවෙන් රු.128,079.00 ක බිල්පත ගෙවීම් කිරීම සඳහා ගරු මහ සභාවේ අනුමැතිය ලබා ගැනීමට මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.ප්‍රේමසිරි ජයලත් මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 04)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
(ඉ) 05. අප සභාවේ සේවයේ නියුතු පහත සඳහන් මහත්ම මහත්මීන් විසින් ආපදා ණය මුදලක් ඉල්ලුම් කර ඇත. එම මුදල සභා අරමුදලින් ගෙවීම් කිරිම සඳහා මා යෝජනා කරනවා.

1.එම්.එම්.පත්මකුමාර සිරිසේන මහතා - රු.102,500.00
2.චමින්ද බටවල මහතා - රු.72,500.00

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.එස්.ජයතිලක මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 05)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 06. යටියන්තොට ප්‍රාදේශීය සභාවට අයත් ආදාහානාගාරය සඳහා රක්ෂණාවරණය ජාතික රක්ෂණ භාර අරමුදලින් අලුත් කිරිමටත්,ඒ වෙනුවෙන් රු 30000.0 ක මුදල සභා අරමුදලින් ගෙවීම් කිරිමටත් ගරු මහ සභාවේ අනුමැතිය ලබා ගැනිමට මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.එස්.ඩබ්.රාජපක්ෂ බණ්ඩාර මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 06)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 07. යටියන්තොට ප්‍රාදේශීය සභාවට අයත් බස් නැවතුම්පල අසල කඩ කාමර 12 ක් සඳහා මාසික කුලිය තක්සේරු කර වාර්තාව එවා ඇත. එම තක්සේරු වාර්තාවට අනුව පහත පරිදි 2022 දෙසැම්බර් මස සිට නව තක්සේරුවට අදාල බදු මුදල අයකර ගැනීම ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

| කඩ කාමර අංකය | මාසික වෙළඳපල කුලිය |
|---|---|
| අංක 01 සිට 10 දක්වා | 8,750.00 |
| අංක 11 | 6,800.00 |
| අංක 12 | 7,500.00 |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 07)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.පී.ප්‍රේමසිරි ජයලත් මැතිතුමා ඔබගේ යෝජනාව මේ ගරු සභාවට ඉදිරිපත් කරන්න.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.පී.ප්‍රේමසිරි ජයලත් මැතිතුමා (ඉ) 08.** ගල්පාත කොට්ඨාශයේ කන්දේවත්ත මාර්ගයේ මුල කොටසට හානි වී ඇති බවත් ගනේපිටියවත්ත මාර්ගයේ වෙල්යාය අසල මාර්ගයට ද හානි වී ඇති බැවින් එය පිළිසකර කර ගැනිමට අවශ්‍ය කටයුතු සිදු කර දෙන මෙන් මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ආර්.නන්දසේන වික්‍රමසූරිය මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 08)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශාන්ත හෙට්ටිකන්ද මැතිතුමා ඔබගේ යෝජනාව ඉදිරිපත් කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශාන්ත හෙට්ටිකන්ද මැතිතුමා** (ඉ) 09. ගරු සභාපතිතුමනි, ඉදිරියේ දි පැවැත්වීමට නියමිත පළාත් පාලන මැතිවරණය කල් නොදමා පැවැත්විය යුතු බවට මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.ඡන්දයකට අපිත් කැමතියි.දැන් මන්ත්‍රී සංඛ්‍යාවත් අඩු කරන්න හදන්නේ.ඒ ක්‍රමය හොඳයි.රටේ තිබෙන ආර්ථික ගැටලුවක් එක්ක මැතිවරණයක් පැවැත්වීම අපහසුයි.ආර්ථික ගැටලු ජයගෙන ඡන්දයකට යාම සුදුසුයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.නිමල් විජේසූරිය මැතිතුමා** ගරු සභාපතිතුමනි, පළාත් සභා ඡන්දය පැවැත්විය යුතුයි.මන්ත්‍රී ධූර පත් කිරිමේ දි අධ්‍යාපන සුදුසුකම් බලන්න ඕන.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාවට අනුව පළාත් පාලන මැතිවරණය පැවැත්විය යුතු බව සම්බන්ධයෙන් සභාවේ විවිධ අදහස් මතුවෙනවා.එම නිසා විෂය සීමාව ඉක්මවා ගිය කරුණක් නිසා තව දුරටත් සාකච්ඡා නොකරන ලෙස මා දන්වා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව තව දුරටත් සාකච්ඡා නොකිරිම සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 09)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා (ඉ) 10.** 2022 වර්ෂයේ ප්‍රාදේශීය සභා අරමුදල් යොදවා ඉටු කිරිමට යෝජනා කරන ලද පහත ව්‍යාපෘතියට අදාළ ඇස්තමේන්තු සඳහා අනුමැතියත් අනුමත සමිතියක් මගින් ඉටු කිරිමටත් ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

01.යටියන්තොට ප්‍රාදේශීය සභා ක්‍රීඩාංගනය සංවර්ධනය කිරිම - රු.2,000,000.00

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 10)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා (ඉ) 11.** යටියන්තොට බලවත්තොට ඕවිටේ වත්ත නැමති ඉඩම බදු දීම ආදායම් පරීක්ෂක තක්සේරුව මත රු.12000.00 ක් අවම ලංසුව තබා 2023 වර්ෂය සඳහා ටෙන්ඩර් කිරිමට ගරු මහා සභාවේ අනුමැතිය ලබා ගැනීමට මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ සංජීව අබේකෝන් මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් යටියන්තොට බලවත්තොට ඕවිටේ වත්ත නැමති ඉඩම බදු දීම ආදායම් පරීක්ෂක තක්සේරුව මත රු.12000.00 ක් අවම ලංසුව තබා 2023 වර්ෂය සඳහා ටෙන්ඩර් කිරිමට ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 11)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 12. 2022 විවිධ ණය හිමි ලේඛණයේ පවතින තවදුරටත් රඳවා ගැනීමේ අවශ්‍යතාවයක් නොමැති කර්මාන්ත ණයහිමි ශේෂය වන රු.85203.52 , ගබඩා ණයහිමි ශේෂය රු.81520.00 , විවිධ ණය හිමි ශේෂය රු.1136378.62 මුදල සමුච්චිත අරමුදලට බැර කිරීමට සකස් කළ උප ලේඛන ගරු මහ සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා මා යෝජනා කරනවා.

**විවිධ ණය හිමි උපලේඛන**

| අනු අංකය | වර්ශය | වැය ශීර්ෂය | කාරණාව | ණය හිමි ලෙස වෙන් කළ ඇති මුදල | වර්ෂයේ වියදම | ඉතිරිය | සමුච්චිත අරමුදලට බැර කළ යුතු මුදල |
|---|---|---|---|---|---|---|---|
| 1 | 2018 | 109(1) | CCTV කැමරා මිලදී ගැනිම | 100,000.00 | | 100,000.00 | 100,000.00 |
| 2 | 2018 | 209(1) | ආදාහනාගාරය සඳහා ජෙනරේටරයක් මිලදී ගැනිම | 1,000,000.00 | | 1,000,000.00 | 1,000,000.00 |
| 3 | 2020 | 105(9)3 | විගණන ගාස්තු ගෙවීම | 200,000.00 | 199,680.00 | 320.00 | 320.00 |
| 4 | 2021 | 105(9)3 | විගණන ගාස්තු ගෙවීම | 200,000.00 | 195,600.00 | 4,400.00 | 4,400.00 |
| | | | **විදුලි බිල්පත් පියවීම** | | | | |
| 5 | 2021 | 105(3) 1 | පොදු පරිපාලනය | 10,000.00 | 8,077.55 | 1,922.45 | 1,922.45 |
| 6 | 2021 | 205(3)3 | සෞඛ්‍ය සේවා | 8,150.00 | 7,047.70 | 1,102.30 | 1,102.30 |
| 7 | 2021 | 605(3)1 | සුබ සාධක සේවා | 6,190.00 | 1,397.10 | 4,792.90 | 4,792.90 |
| | | | **ජල බිල්පත් ගෙවීම** | | | | |
| 8 | 2021 | 105(3) 2 | පොදු පරිපාලනය | 10,000.00 | 4,808.88 | 5,191.12 | 5,191.12 |
| 9 | 2021 | 205(3)4 | සෞඛ්‍ය සේවා | 600.00 | 578.16 | 21.84 | 21.84 |
| | | | **දූරකතන බිල්පත් පියවීම** | | | | |
| 10 | 2021 | 105(2)1 | පොදු පරිපාලනය | 10,700.00 | 8,614.92 | 2,085.08 | 2,085.08 |
| 11 | 2021 | 605(2)2 | සුබ සාධක සේවා | 5,265.00 | 572.07 | 4,692.93 | 4,692.93 |
| | | | **ගමන් වියදම් පියවීම** | | | | |
| 12 | 2021 | 102(1) | K.M.ගුණතිලක මහතා | 5,000.00 | 4,500.00 | 500.00 | 500.00 |
| 13 | 2021 | 102(1) | M.W.අමිල පුෂ්පකුමාර | 4,200.00 | 3,850.00 | 350.00 | 350.00 |
| 14 | 2021 | 102(1) | K.G.අනිල් ශාන්ත | 4,500.00 | | 4,500.00 | 4,500.00 |
| 15 | 2021 | 102(9) | K.D.වසන්ත කුමාර මහතා (සභාපති) | 12,000.00 | 5,500.00 | 6,500.00 | 6,500.00 |
| | | | එකතුව | 1,576,605.00 | 440,226.38 | 1,136,378.62 | 1,136,378.62 |

**කර්මාන්ත ණය හිමි උපලේඛන**

| අනු අංකය | වර්ෂය | වැය ශීර්ෂය | කාරණාව | ණය හිමි ලෙස වෙන් කළ ඇති මුදල | වර්ෂයේ වියදම | ඉතිරිය | සමුච්චිත අරමුදලට බැර කළ යුතු මුදල |
|---|---|---|---|---|---|---|---|
| 1 | 2021 | 309(7) | ලියන්ඔය නාන තොටුපල සංවර්ධනය කිරීම | 50,000.00 | 49,888.04 | 111.96 | 111.96 |
| 2 | 2021 | 309(7) | සීපෝත් මැද මාර්ගයේ බෝක්කුව සකස් කිරීම | 50,000.00 | 38,291.71 | 7453.66 | 7453.66 |
| 3 | 2021 | 309(7) | ගරාගොඩ වසමේ කබරගල ජනපදයේ ඉහළ කොටස අතුරු මාර්ගය සංවර්ධනය කිරීම | 300,123.43 | 296,840.12 | 3283.31 | 3283.31 |
| 4 | 2021 | 309(7) | කබුළුමුල්ල ඇල්ලහේන මාර්ගය සංවර්ධනය කිරීම | 269,814.46 | 259,933.59 | 9880.87 | 9880.87 |
| 5 | 2021 | 309(7) | පාසල් මාවත සංවර්ධනය කිරීම | 100,000.00 | 86,816.90 | 3636.78 | 3636.78 |
| 6 | 2021 | 309(7) | තැලිගම සමෘද්ධි කාර්යාලය ඉදිරිපිට මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 150,000.00 | 149,422.36 | 577.64 | 577.64 |
| 7 | 2021 | 309(7) | යටියන්තොට පුස්තකාල ගොඩනැගිල්ල ඉහල මහල ඉදි කිරීම (III වන අදියර) | 1,900,000.00 | 1,851,000.00 | 49,000.00 | 49,000.00 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 8 | 2021 | 309(7) | යටියන්තොට පුස්තකාල ගොඩනැගිල්ල ඉහල මහල ඉදි කිරීම I වන අදියරේ අවශ්‍ය බිල්පත් ගෙවීම සඳහා (අතිරේක මුදල්) | 65,465.10 | 65,000.00 | 465.10 | 465.10 |
| 9 | 2021 | 309(7) | නවට පෙරපාසල සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියට අදාළ අවසන් බිල්පත ගෙවීම සඳහා (අතිරේක මුදල්) | 46,773.70 | 35,979.50 | 10794.2 | 10794.2 |
| | | | | 2,932,176.69 | 2,833,172.22 | 85,203.52 | 85,203.52 |

**ගබඩා ණය හිමි උපලේඛන**

| අනු අංකය | වර්ෂය | වැය ශීර්ෂය | කාරණාව | ණය හිමි ලෙස වෙන් කළ ඇති මුදල | වර්ෂයේ වියදම | ඉතිරිය | සමුච්චිත අරමුදලට බැර කළ යුතු මුදල |
|---|---|---|---|---|---|---|---|
| 1 | 2021 | 203(9) | ෆයර් එක්ස් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්)ලිමිටඩ්-ගිනි නිවන උපකරණ නැවත පුරවා ගැනීම. | 26,100.00 | | 26,100.00 | 26,100.00 |
| 2 | 2021 | 205(3) 5 | සි/ස/විවිධ සේවා සමුපාකාර සමිතිය-ආදාහනාගාරය සතු ගෑස් සිලින්ඩර් 08ක් නැවත පිරවීම සඳහා ගාස්තු | 70,928.00 | 52,008.00 | 18,920.00 | 18,920.00 |
| 3 | 2021 | 503(9) | තිලක් එන්ටර්ප්‍රයිසස්-වයර් රෝල් සපයා ගැනීම | 36,500.00 | | 36,500.00 | 36,500.00 |
| | | | එකතුව | 133,528.00 | 52,008.00 | 81,520.00 | 81,520.00 |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.නන්දසේන වික්‍රමසූරිය මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 12)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා (ඉ) 13.** මීට පෙර අනුමත කරන ලද ගනේපල්ල වත්තේ අංක 1සහ 2 කොටස මාර්ගය සංවර්ධනය කිරිම සඳහා වූ ඇස්තමේන්තු දෙකක් වෙනුවට (රු.150000.00) නව මිල ගණන් යටතේ සකස් කර ඇති රු.ලක්ෂ 03 ක සංශෝධිත ඇස්තමේන්තුව ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.
**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 13)**

**හදිසි යෝජනා**
**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා (ඉ) 14.** අවිස්සාවේල්ල දිසා අධිකරණයේ නඩු අංක 22575/පී යටියන්තොට නව සතිපොළ භූමිය නඩුවට අදාල ශ්‍රේෂ්ඨාධිකරණ අභියාචනා නඩු අංක එස්සී/එච්සීසීඒ/එල්ඒ125 /2022 නඩුවේ ෆොක්සිය සකස් කිරිම සඳහා වන නීතිඥ ගාස්තු වශයෙන් රු.50000.00 ක බිල්පතක් ,එකී නඩුවේ නීතිඥ රොහාන් සහබන්දු මහතා විසින් ඉදිරිපත් කර ඇත.2022.11.15 එම බිල්පත පියවීම සඳහා ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.සත්‍යානන්දන් මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 14)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා (ඉ) 15**. යටියන්තොට ප්‍රාදේශීය සභාවට අයත් පහත වාහන වල රක්ෂණ වාරික ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සංස්ථාව වෙත ගෙවීම් කිරීමට මා යෝජනා කරනවා.

1)SGPF 7470 - ඩබල් කැබ් රථය = රු.95,970.83
2)SGZA 0324 - බොබ්කැට් යන්ත්‍රය= රු.30,418.50

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 15)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (16) යටියන්තොට ප්‍රාදේශීය සභාවට අයත් SGLL 7733 දරන කෘ කැබ් රථය සේවා කිරීම වෙනුවෙන් C.N.S සර්විස් සෙන්ටර් වෙතින් රු.28,480.00 ක බිල්පත් වටිනාකමට ගෙවීම් කිරීමට මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.නන්දසේන වික්‍රමසූරිය මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 16)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා (ඉ) 17.** 2022 වර්ෂයේ ප්‍රාදේශීය සභා අරමුදල් යොදවා ඉටු කිරීමට යෝජනා කරන ලද පහත ව්‍යාපෘති වලට අදාළ ඇස්තමේන්තු සඳහා අනුමැතියක් අනුමත සමිතියක් මගින් ඉටු කිරීමටත් ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

1.මල්වත්ත තොටුපල මාර්ගය සංවර්ධනය කිරීම( සංශෝධිත ඇස්තමේන්තු) - රු.75,000.00
2.මැද්දවත්ත පාලම අසල බෝක්කුව ඉදි කිරීම (සංශෝධිත ඇස්තමේන්තු) - රු.75,000.00
3.දෙගල්ලස්ස පහළ කොටස කොළණිය මාර්ගය සංවර්ධනය කිරීම - රු.150,000.00
4.පහළ ගරාගොඩ පේරකොටුව මාර්ගයේ අතුරු පාර සංවර්ධනය කිරීම - රු.150,000.00

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.
සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 17)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 18. යටියන්තොට ප්‍රදේශයේ මේ වන විට මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් අවදානම් තත්ත්වයක් වැඩිපුර අසන්නට ලැබේ.ඒ පිළිබඳව මීගස්තැන්න කොට්ඨාශයේ පාසල් වියේ පසුවන තරුණ තරුණියන් ඉලක්ක කර ගනිමින් දෙගල්ලස්ස භාරතී දෙමළ විද්‍යාලයේ 2022.11.29 දින වැඩමුළුවක් පැවැත්වීමට සහ ඒ සඳහා රු.15000.00 ක උපරිමයකට යටත්ව සභා අරමුදලින් වියදම් දැරීමට ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.නන්දසේන වික්‍රමසූරිය මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 18)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා (ඉ) 19.** 2022 වර්ෂයේ ප්‍රාදේශීය සභා අරමුදල් යොදවා ඉටු කරන ලද කර්මාන්තවල බිල්පත් වටිනාකම ගෙවීමට ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

**1.**තැලිගම සමෘද්ධි කාර්යාලය අසල මාර්ගය කොන්ක්‍රීට් කිරීම 2 වන අදියර - රු.150,000.00
2.ආදාහනාගාරය විමිණිය කොටසක් කපරාදු කිරීම - රු.104,225.58

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි සීතා රංජනි මැතිනිය** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 19)**

**(ඊ) කාරක සභා වාර්තා සළකා බැලීම**

**(උ) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ එකතු කළ ආදායම් පිළිබඳ මාසික වාර්තා**

01 .2022 ඔක්තොම්බර් මාසයට අදාල වියදම් වාර්තාව
02. 2022 ඔක්තොම්බර් මාසයට අදාල ආදායම් වියදම් වාර්තාව
03. 2022 ඔක්තොම්බර් මාසයට අදාල ආදායම් ප්‍රගති වාර්තාව
04. 2022 ඔක්තොම්බර් මාසයට අදාල අපේක්ෂිත සත්‍ය අදායම් හා වියදම් වාර්තාව

**(ඌ) වෙනත් කරුණු**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඩබ්.එච්.ජී.බණ්ඩාර මැතිතුමා** ගරු සභාපතිතුමනි,සීපෝත් හා අවට වසම් සඳහා සභාව මගින් ක්‍රියාත්මක වන ආයුර්වේද වෛද්‍යය සායනයක් ලබා දෙන ලෙස මා ඉල්ලා සිටිමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා** ගරු සභාපතිතුමනි, ගරාගොඩ පාලම ගැන පාර්ලිමේන්තුවෙත් කථා කළා.ගරු රංජිත් සියඹලාපිටිය මැතිතුමාටත්,ගරු රාජිකා වික්‍රමසිංහ මැතිනියටත් අපි බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. මේ සඳහා ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමාට මාගේ ස්තුතිය පුද කර සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි එච්.ජී.ඩී.ප්‍රසාදිකා මැතිනිය** ගරු සභාපතිතුමනි,මේ ගරාගොඩ පාලම සඳහා ආණ්ඩුකාරතුමා මිලියන 150 ක් වෙන් කරලා තියෙනවා.

**ගරු ප්‍රාදේශී සභා මන්ත්‍රී ජී.ආර්.ලාල් නිශාන්ත මැතිතුමා** ගරු සභාපතිතුමනි,පාර්ලිමේන්තු අයවැයේදි ගරාගොඩ පාලම සඳහා ප්‍රතිපාදන වෙන් වුණා.ඒක කැප වූ සියළුම දෙනාට ස්තුතිවන්ත වෙනවා.නමුත් මෙම පාලම අවුරුදු 120 ක් පමණ පැරණියි.මෙම පාලම තිබියදී අළුතින් පාලමක් ඉදි කිරීම තමයි සුදුසුයි.පැරණි පාලම සංරක්ෂණය කිරීම මගින් පෞරානික වටිනාකමත් ආරක්ෂා කර ගත හැකිය.

**ගරු උප සභාපති ඒ.වි.රොහාන්ත ගුණසේකර මැතිතුමා** ගරු සභාපතිතුමනි, අප රටේ රජයේ පාසැල් අධ්‍යාපනය ක්‍රමය තුළ පවතින සම්ප්‍රදායන් අතර,හරවත් හා අප සංස්කෘතියට ගැලපෙන බොහෝ දේ ඇත.ඒ අතරින් පාසැල් ගුරුවරුන්ගේ ඇඳුම වඩාත් වැදගත් වේ.සමහර ගුරු සංගම් විසින් මේ දිනවල ගුරුවරියන් සාරිය හෝ ඔසරිය වෙනුවට කැමති පහසු ඇඳුමකින් පාසැල් වලට පැමිණිය යුතු බවට මතයක් ඇතිකරමින් සිටී.මෙය ක්‍රියාත්මක වුවහොත් ගුරු ගෞරවයට හානිකර බලපෑම් ඇති විය හැකියි.එබැවින් මෙරටේ රජයේ පාසැල්වල ගුරුවරියන්ගේ පාසැල් ඇඳුම ලෙස තවදුරටත් ඔසරිය හා සාරිය පවත්වාගෙන යා යුතු බවට ප්‍රකාශ කර සිටිමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම් කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා** ගරු සභාපතිතුමනි,උප සභාපතිතුමාගේ යෝජනාවට අපි එකඟ වෙනවා. වෘත්තීය සමිති ඕන ඕන විදිහට තමයි මේ ගුරුවරු හසුරවන්නේ,දරුවන්ගේ අනාගතය ගැන හිතලා සාරියක් හෝ ඔසරියක් ඇඳගෙන එන්න කියලා සම්මත කර ගෙන අධ්‍යාපන අමාත්‍යාංශයට යෝජනා කරමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.සත්‍යානන්දන් මැතිතුමා** ගරු සභාපතිතුමනි, අදාල වෘත්තිය සමිතිවලට අපි විරෝධය දක්වමු.දරුවන්ගේ ගුරුවරයාගේ තියෙන බැඳීම අඩු වෙනවා. මේ නිසා අපි මේක නවත්වන්න ඕන.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ටී.ඉමල්කා සංජීවනි මැතිනිය** ගරු සභාපතිතුමනි, අපිනම් තදින්ම විරුද්දයි.ගුරුවරුනම් සාරිය හෝ ඔසරිය ඇඳිය යුතුමයි. දරුවන් ගුරුවරු තමයි අනුකරණය කරන්නේ.ඒ ඇඳුම නිසා අපිත් තාමත් ගුරුවරුන්ට ගෞරව කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.එස්.ජයතිලක මැතිතුමා** ගරු සභාපතිතුමනි,අපි පැරණි සංස්කෘතියට ඉඩ දෙන්න ඕන. ගුරුවරු සාරිය හෝ ඔසරිය ඇඳිය යුතුය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලසික දෙයියාගල මැතිතුමා** ගරු සභාපතිතුමනි, අපේ පාසල්වල ගුරුවරුනම් සාරියට පටහැනිව වෙනත් ඇඳුමක් අඳිනවට අකමැතියි. මෙමගින් ගුරු ගෞරවයට හානියක් සිදු වෙනවා. උප සභාපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අදාළ ආයතනවලට යවන්න ඕන.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් කුමාරසිරි මැතිතුමා** ගරු සභාපතිතුමනි, පාසල්වල ගුරුවරුන් සාරිය අඳින්නම ඕන.මේ පිළිබඳ අධ්‍යාපන අමාත්‍යංශයට යොමු කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් විජේසූරිය මැතිතුමා** ගරු සභාපතිතුමනි, රාජ්‍ය නිලධාරින්ට පහසු ඇඳුමෙන් සැරසිලා එන්න කියල තමයි චක්‍රලේඛ නිකුත් කරලා තියෙන්නේ, ගුරුවරුන් හඳුනා ගැනීම සඳහා එකම ඇඳුමක් තියෙන්න ඕන. මේ සඳහා වගකිව යුතු දෙපාර්තමේන්තු වෘත්තිය සමිති වලට කියන්න ඕන.ඒ ඇඳුම කුමක් හෝ වේවා ඒක දෙපාර්තමේන්තුවේ වගකීමක්,ලංකාවේ ඕනම තැනක දුටුවාම මේ ගුරුවරයෙක් කියලා හඳුනා ගැනීමට පුළුවන් අනන්‍යතාවයක් සහිත ඇඳුමක් සකස් වෙනවා නම් හොඳයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ඒච්.ඩී.ප්‍රසාදිකා දිල්සානි මැතිනිය** ගරු සභාපතිතුමනි ,සාමාන්‍යයෙන් ලංකාවේ ඒකම සංස්කෘතිය තමයි ගුරුවරුන් සාරිය හෝ ඔසරියෙන් සැරසී සිටීම .දරුවන් වැඩි කාළයක් ගත කරන්නේ ගුරුවරුන් සමඟ ,අදත් අපි ගුරුවරු දැක්කාම වඳිනවා. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ අපි සියළුම දෙනාම ගරු උප සභාපතිතුමාගේ අදහසට සහයෝගය දක්වනවා.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි ජේස් සුදර්ශන් මැතිතුමා** ගරු සභාපතිතුමනි, මේ කට්ටිය කොහොම කිවුවත් ගුරුවරු වෙනත් ඇඳුමක් අඳින්නේ නෑ. ඒයාලා සාරියම තමයි අඳින්නේ.

**01.නොපැමිණි ගරු මන්ත්‍රීතුමන්ලාගේ නිවාඩු අනුමත කිරීම**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ජේම්.නන්දසේන වික්‍රමසූරිය මැතිතුමා** ගරු සභාපතිතුමනි, ගරු ප්‍රාදේශීය සභා එච්.පි.ප්‍රියන්ත පුෂ්ප කුමාර මැතිතුමා අසනීප වීම නිසා අද දින සභාවට පැමිණීමට නොහැකි බව දන්වා සිටිනවා.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අමිල හේමන්ත මැතිතුමා විදේශ ගත වී ඇති බැවින් සභාවට පැමිණීමට නොහැකි බව දන්වා ඇත. එබැවින් අද දින නිවාඩු ලබා දෙන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඒ.ප්‍රියන්ත පුෂ්පකුමාර මැතිතුමා අසනීප වීම නිසා අද දින සභාවට පැමිණීමට නොහැකි බවත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අමිල හේමන්ත මැතිතුමා කලින් දන්වා විදේශ ගත වී ඇති බැවින් සභාවට පැමිණීමට නොහැකි බව දන්වා ඇත. ඒබැවින් අද දින නිවාඩු අනුමත කරන බව ගරු මහ සභාවට මා දන්වා සිටිනවා.

**02.ගරු මන්ත්‍රීතුමන්ලාගේ අදහස් දැක්වීම**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලාල් නිශාන්ත මැතිතුමා** ගරු සභාපතිතුමනි, ගරාගොඩ ,කබුළුමුල්ල මත්ද්‍රව්‍ය නිවාරණ වැඩ සටහන සඳහා සක්‍රිය දායකත්වය ලබා දුන් ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයටත් ලේකම්තුමා ඇතුළු කාර්යය මණ්ඩලයටත් මාගේ ස්තුතිය පුද කර සිටිනවා.

**ගරු උප සභාපති ඒ.වී.රොහාන්ත ගුණසේකර මැතිතුමා** ගරු සභාපතිතුමනි, ගරු සභාපතිතුමා හා ලේකම්තුමා කාර්යය මණ්ඩලය ඒක්ව කසල කළමණාකරන වැඩ සටහන සඳහා විශාල සහයෝගයක් දක්වනවා.ඒ සඳහා කැප වූ සියළුම දෙනාට ස්තුතිවන්ත වෙනවා.ඒ වගේම නොදිරන කසල ඒකතු කිරීම සඳහා මාසයකට ඒක් දිනක්වත් වෙන්කර වාහන යොදවන ලෙසත් මා ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් කුමාරසිරි මැතිතුමා** ගරු සභාපතිතුමනි, වමේ දිනවල වගා කරන ගොවින් වැඩි වශයෙන් ඉන්නවා. ඒ අයගේ වගාවට සත්තුන්ගේ බොහෝ හානි සිද්දධ වෙනවා. ඒ නිසා වායු රයිෆර් ගන්න පුළුවන්නම් හොඳයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ජේම්.ජේස්.රාජපක්ෂ බණ්ඩාර මැතිතුමා** ගරු සභාපතිතුමනි, හතමුණේවත්ත ඉඩම් කැබලි මේ වන විට ටෙණ්ඩර් කර ඇති බැවින් මායිම් ලකුණු කර දෙන ලෙස ඉතා කාරුණිකව ඉල්ලා සිටිමි. තවද මත්තමගොඩ කුණු ප්‍රශ්නයට විසඳුමක් ලබා දී තිබුණත් ඉන්ධන හිඟ වීම නිසා කුණු ප්‍රශ්ණය නැවත වරක් මතු වී ඇත. ඉන්ධන ගැටළුව විසදිලා තියෙන නිසා ට්‍රැක්ටරය ලබා දෙන ලෙස ඉල්ලා සිටිමි.

***සභාපතිතුමාගේ ස්තුති කථාව**

අද දින 2023 ට අදාල අයවැය ලේඛනය කිසිදු විරෝධයකින් තොරව ඒකමතිකව සම්මත වුණා ඒ පිළිබඳව මා සතුටුවනවා. සභාවේ කටයුතු සාර්ථක කර ගැනීමට හැකි වීම පිළිබඳව ගරු මන්ත්‍රී මණ්ඩලයටත්, කාර්යය මණ්ඩලයටත් ගෞරවනීය ස්තුතිය පුද කරමින් ප.ව 11.45 ට පමණ මහ සභා රැස්වීම අවසන් කරන ලදි.